මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය
நிதி, பொருளாதார உறுதிப்பாடு மற்றும் தேசியக் கொள்கைகள் அமைச்சு
MINISTRY OF FINANCE, ECONOMIC STABILIZATION AND NATIONAL POLICIES

මහලේකම් කාර්යාලය, කොළඹ 01, ශ්‍රී ලංකාව
செயலகம், கொழும்பு 01, இலங்கை.
The Secretariat, Colombo 01, Sri Lanka.

කාර්යාලය / அலுவலகம் / Office: 011-2484500, 011-2484600, 011-2484700
ෆැක්ස් / தொலைநகல் / Fax: 011-2449823
වෙබ් අඩවිය / இணையதளம் / Website: www.treasury.gov.lk


මගේ අංකය / எனது இல / My No:
ඔබේ අංකය / உமது இல / Your No:
දිනය / திகதி / Date: 13.09.2024

## පුවත්පත් නිවේදනය

### 2024 .09.12 වැනි දින පවත්වන ලද භාණ්ඩාගාර බැඳුම්කර වෙන්දේසිය සාර්ථක ලෙස අවසන් කිරීම

රුපියල් බිලියන 168.5ක් වටිනා කල් පිරෙන භාණ්ඩාගාර බැඳුම්කර සහ කූපන් ගෙවීම් වන රුපියල් බිලියන 122.3ක් මූල්‍යනය සඳහා මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය/ මහා භාණ්ඩාගාරය, ශ්‍රී ලංකා මහ බැංකුව හරහා රුපියල් බිලියන 290ක් 2024.09.12 පැවති භාණ්ඩාගාර බැඳුම්කර වෙන්දේසියේදී වෙළෙඳපොළට පිරිනමන ලදී.

ජාත්‍යන්තර ප්‍රශස්ථ භාවිතයන්ට අනුකූලව තොරතුරු වල විනිවිදභාවය සහතික කිරීම සඳහා බැඳුම්කර වෙන්දේසි දින දර්ශනය කල්තියා ප්‍රකාශයට පත් කෙරේ. මෙම විශේෂිත වෙන්දේසිය 2024.06.12 දින ප්‍රකාශයට පත් කරන ලද වෙන්දේසි දින දර්ශනය තුළ වසර 3, වසර 5 සහ වසර 10 යනාදී කල්පිරීම් වලින් රුපියල් බිලියන 300ක් පිරිනමන බවට නිවේදනය කරනු ලැබීය. පසුව, 2024.08.29 දින පැවැත්වීමට සැලසුම් කර තිබූ වටිනාකම රුපියල් බිලියන 30ක් වන භාණ්ඩාගාර බැඳුම්කර වෙන්දේසිය ඵලදා අනුපාතවල නිරීක්ෂණය කරන ලද සහ විය හැකි ඉහළ පීඩනය සැලකිල්ලට ගනිමින් අවලංගු කිරීමත් සමඟ 2024.08.26 දින ප්‍රකාශයට පත් කරන ලද යාවත්කාලීන වෙන්දේසි දින දර්ශනය තුළ වෙන්දේසියේ ප්‍රමාණය රුපියල් බිලියන 290ක් දක්වා අඩු කරන ලදී.

රජයේ සුරැකුම්පත් සඳහා වූ මෑත කාලීන වෙන්දේසි සියල්ලේදීම පොලී අනුපාතික මත ක්‍රමානුකූලව ඉහළ යන පීඩනයක් ඇතිවන බව නිරීක්ෂණය විය. උදාහරණයක් ලෙස, 2024.08.01 දින, මාස 6 ක් දක්වා වන භාණ්ඩාගාර බිල්පත්හි ඵලදා අනුපාතිකය වසරකට 9.34%ක් වූ අතර, 2024.09.11 දින, මාස 6 ක් දක්වා වන භාණ්ඩාගාර බිල්පත්හි ඵලදා අනුපාතිකය වසරකට 10.24% දක්වා ඉහළ ගොස් තිබුණි. ඒ හා සමානව, 2024.09.12 දින පවත්වන ලද වෙන්දේසිය සාපේක්ෂ වශයෙන් විශාල පරිමාවක් සහිත ඉහළ ලංසු තැබීමක්, සියලු කල්පිරීම් හරහා පිළිබිඹු විය. රජය විසින් ක්‍රියාත්මක කරන ලද තීරණාත්මක රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති ක්‍රියාමාර්ගවල ප්‍රතිඵලයක් ලෙස රාජ්‍ය මූල්‍ය තත්ත්වය සැලකිය යුතු ලෙස වර්ධනය වී ඇතත්, 2024.09.12 වැනි දින පැවති වෙන්දේසිය ඇතුළුව මෑත කාලීන වෙන්දේසිවල ලංසු තැබීමේ රටාව, ඉදිරි මැතිවරණවලට අදාළ අවිනිශ්චිතතාවයන් හා සම්බන්ධ අවදානම් මත වෙළෙඳපොළ මිලකරණය යනාදී සාධක මගින් මෙහෙයවනු ලබන බව පෙනේ.

ඵලදා අනුපාතවල වැඩිවීම කෙටි කාලීන අවිනිශ්චිතතාවය වැනි තාවකාලික සාධක මගින් මෙහෙයවනු ලැබීමට ඉඩ ඇති හෙයින්, පිරිනමනු ලැබූ සමස්ථ මුදල පිළිගැනීමෙන් භාණ්ඩාගාරයට දිගු කාලයක් ඉහළ පිරිවැයක් දැරීමට සිදුවනු ඇත. ඒ අනුව, වසර 10ක කල්පිරීම් සඳහා ලැබුණු ලංසු ප්‍රතික්ෂේප කරන ලද අතර කෙටි කාලීන කල්පිරීම් සඳහා බර තබන ලද සාමාන්‍ය ඵලදා අනුපාතය (WAYR) සාධාරණ මට්ටමකින් පවත්වා ගැනීමට තීරණය කරනු ලැබීය. ඒ අනුව, වසර 3 ක් දක්වා වන භාණ්ඩාගාර බැඳුම්කර වසරකට 13.79% (WAYR) ට නිකුත් කරන ලද අතර වසර 5 ක් දක්වා වන භාණ්ඩාගාර බැඳුම්කර වසරකට 13.98% (WAYR) ට නිකුත් කරන ලදී. එහි ප්‍රතිඵලයක් ලෙස රුපියල් බිලියන 58.5 ක පමණ මූල්‍ය හිඟයක් ඇති වන අතර, මහා භාණ්ඩාගාරයේ මුදල් ප්‍රවාහය මගින් එය මූල්‍යකරණය කරනු ලැබේ.

**එබැවින්, පුළුල් මාධ්‍ය ප්‍රචාරයක් ලැබූ ඇතැම් වැරදි තොරතුරු මත පදනම් වූ ප්‍රකාශයන් නොසලකා, රජයේ සුරැකුම්පත් වෙන්දේසි ක්‍රමයේ හොඳින් ස්ථාපිත ක්‍රියා පටිපාටියට අනුකූලව මෙම වෙන්දේසිය සාර්ථකව අවසන් කරන ලදී. රජය විසින් අනුගමනය කරන ලද ණය කළමනාකරණ උපාය මාර්ග මගින් කල් පිරෙන විශාල ණය ප්‍රමාණය සම්පූර්ණයෙන් ගෙවා දැමීම සහතික කළ අතර, රජය මුහුණ දෙන පොලී පිරිවැය සාධාරණ මට්ටමක පවත්වාගෙන යාම ද සහතික විය.**